සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

11827

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2000 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2000 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2000

**ශුද්ධ ගණිතය II**
**தூய கணிதம் II**
**Pure Mathematics II**

| 05 | |
|---|---|
| S | II |

පැය තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

ප්‍රශ්න හතකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (අ) $f(\lambda)=\lambda^2-2\lambda+2$ යැයි ද $\mathbf{A}=\begin{pmatrix}-1 & -5\\ 1 & 3\end{pmatrix}$ යැයි ද ගනිමු.

$f(\mathbf{A})=\mathbf{O}$ බව පෙන්වන්න; මෙහි $\mathbf{O}$ යනු 2 වන ගණයේ ශුන්‍ය න්‍යාසය යි.

$f(1+i)=0$ බව ද $(1+i)^6=-8i$ බව ද සැලකිල්ලට ගෙන, $\lambda^6 \equiv f(\lambda)g(\lambda)+p\lambda+q$ වන පරිදි වූ, $p$ සහ $q$ තාත්ත්වික නියත දෙකෙහි අගයයන් සොයන්න ; මෙහි $g(\lambda)$ යනු සුදුසු බහුපදයකි.

$\mathbf{A}^6=8\begin{pmatrix}2 & 5\\ -1 & -2\end{pmatrix}$ බව අපෝහනය කරන්න.

(ආ) $\begin{pmatrix}4 & -6\\ 1 & -1\end{pmatrix}$ න්‍යාසය, ද්විමානයේ ලක්ෂ්‍යවල $T$ පරිණාමනය නිරූපණය කරයි.

(i) $T$ යටතේ $(1,2)$ ලක්ෂ්‍යයෙහි ප්‍රතිබිම්බය,

(ii) $T$ යටතේ ප්‍රතිබිම්බය ලෙස $(18,2)$ ලැබෙන්නා වූ ලක්ෂ්‍යය,

සොයන්න.

$T$ යටතේ කවර ලක්ෂ්‍ය අවිචලක වේ ද?

[ පරිණාමනයක් යටතේ ලක්ෂ්‍යයක් අවිචලක යැයි කියනු ලබන්නේ එය එයට ම අනුරූපණය වුවහොත් ය.]

2. $a, b$ යනු තාත්ත්වික සංඛ්‍යා යයි සිතමු.

$$\begin{vmatrix}1 & 1 & 1\\ 1 & a & a^2\\ 1 & b & b^2\end{vmatrix}=(a-1)(b-1)(b-a) \quad \text{බව පෙන්වන්න.}$$

(i) $$\Delta(x)\equiv\begin{vmatrix}1 & 1 & k\\ 1 & x & 2x\\ k & x^2 & 4x^2\end{vmatrix}$$

යැයි සිතමු ; මෙහි $k(\neq 2)$ යනු තාත්ත්වික සංඛ්‍යාවකි. $x=1$ යන්න $\Delta(x)=0$ හි විසඳුමක් වන පරිදි වූ $k$ සොයන්න.

$k$ හි ඉහත අගය සඳහා, $\Delta(x)=0$ විසඳන්න.

(ii) තාත්ත්වික $a$ සඳහා,

$$x+y+z=1$$
$$x+ay+2az=1$$
$$x+a^2y+4a^2z=2$$

ඒකජ සමීකරණ පද්ධතියට, $a\in\left\{0,\frac{1}{2},1\right\}$ නම් විසඳුමක් නොමැති බව පෙන්වා,

$a\notin\left\{0,\frac{1}{2},1\right\}$ නම් අනන්‍ය විසඳුම සොයන්න.

[ අනෙක් පිට බලන්න.

3. ධන නිඛිලමය දර්ශකයක් සඳහා, ද මුවාවර් ප්‍රමේයය ප්‍රකාශකර සාධනය කරන්න.

(i) $z = \cos\theta + i\sin\theta$ නම්,

$z^n + \frac{1}{z^n} = 2\cos n\theta$ බව සාධනය කරන්න; මෙහි $\theta \in \mathbb{R}, n \in \mathbb{Z}^+$ වේ.

$\omega = \cos\phi + i\sin\phi$ සංකීර්ණ සංඛ්‍යාව $\omega^3 = i$ සපුරාලයි. $\omega^3 + \frac{1}{\omega^3} = 0$ බව පෙන්වන්න.

$\omega^3 + \frac{1}{\omega^3} = 0$ වන පරිදි වූ $\phi$ හි අගයයන් නිර්ණය කරන්න.

$\omega^3 = i$ සපුරාලන්නා වූ $\omega$ හි ප්‍රභින්න අගයයන් තුනක් අපෝහනය කරන්න.

(ii) ද මුවාවර් ප්‍රමේයය යොදා,

$n \in Z$ විට $\theta \neq n\pi + \frac{\pi}{2}$ සඳහා,

$$\frac{\cos 6\theta}{\cos^6\theta} = 1 - 15\tan^2\theta + 15\tan^4\theta - \tan^6\theta$$

බව පෙන්වන්න.

$$\tan^6\theta - 15\tan^4\theta + 15\tan^2\theta - 1 = 0$$

වන පරිදි වූ $\theta$ හි අගයයන් නිර්ණය කරන්න.

$x^3 - 15x^2 + 15x - 1 = 0$ සමීකරණයේ මූල සැලකීමෙන්, $\tan\frac{\pi}{12}$ හි අගය ලබාගන්න.

4. $z_0 = \cos\frac{\pi}{7} + i\sin\frac{\pi}{7}$ සංකීර්ණ සංඛ්‍යාව, ආගන්ඩ් රූ සටහනෙහි $A$ ලක්ෂ්‍යයෙන් නිරූපණය වේ.

$\omega = \frac{\cos 3\pi}{7} + i\sin\frac{3\pi}{7}$ විට $p = \omega z_0$ සංකීර්ණ සංඛ්‍යාවට අනුරූප $P$ ලක්ෂ්‍යය සලකුණු කරන්න.

$B$ සහ $C$ යනු පිළිවෙළින් $z_0^3$ සහ $z_0^9$ ට අනුරූප ලක්ෂ්‍ය වන අතර $Q$ සහ $R$ මගින් පිළිවෙළින් $q$ සහ $r$ සංඛ්‍යා නිරූපණය කරයි ; මෙහි $q = \omega z_0^3$ සහ $r = \omega z_0^9$ වේ. $B, C, Q$ සහ $R$ ලක්ෂ්‍ය සලකුණු කර,

(i) $A\hat{O}C = B\hat{O}C$

සහ (ii) $AC = BC$

බව පෙන්වා, $A\hat{B}C$ හි අගය ලබාගන්න.

$\text{Arg}\left(\frac{q-p}{q-r}\right) = \frac{3\pi}{7}$ බව ද $z_0 + q + z_0^3 + p + z_0^9 + r$ සංඛ්‍යාව හුදෙක් අතාත්ත්වික බව ද පෙන්වන්න.

5. (අ) $O$ මූලයකට අනුබද්ධ ව, $A, B, C$ ලක්ෂ්‍යවල පිහිටුම් දෛශික පිළිවෙළින් $-\mathbf{i}+\left(1+\sqrt{3}\right)\mathbf{j}+\mathbf{k}$, $\sqrt{3}\,\mathbf{i}+2\mathbf{j}+\mathbf{k}$ සහ $\mathbf{j}+\mathbf{k}$ වෙයි; මෙහි $\mathbf{i}, \mathbf{j}, \mathbf{k}$ ට සුපුරුදු අර්ථය ඇත. $A, B, C$ ඒක රේඛීය නොවන බව පෙන්වන්න.

(i) $AB$ සහ $AC$ හි දිග

(ii) $BAC$ කෝණය

(iii) $ABC$ ත්‍රිකෝණයේ වර්ගඵලය සහ $A$ සහ $BC$ අතර කෙටිම දුර

(iv) $BC$ හි මධ්‍ය ලක්ෂ්‍යයට $A$ යා කෙරෙන රේඛාවේ දෛශික සමීකරණය

සොයන්න.

(ආ) $\mathbf{a}, \mathbf{b}, \mathbf{c}, \mathbf{d}$ පිහිටුම් දෛශික සහිත $A, B, C, D$ ලක්ෂ්‍ය හතර ඒකතල වේ නම්, එවිට

$$[\mathbf{a}\,\mathbf{b}\,\mathbf{c}]+[\mathbf{a}\,\mathbf{c}\,\mathbf{d}]=[\mathbf{a}\,\mathbf{b}\,\mathbf{d}]+[\mathbf{b}\,\mathbf{c}\,\mathbf{d}]$$

බව සාධනය කරන්න.

[මෙහි $[\mathbf{x}\,\mathbf{y}\,\mathbf{z}]$ යන්නෙන් ඕනෑම $\mathbf{x}, \mathbf{y}, \mathbf{z}$ දෛශික තුනක $\mathbf{x}\times\mathbf{y}\cdot\mathbf{z}$ අදිශ ත්‍රිත්ව ගුණිතය හැඳින්වේ.]

6. (අ) $\alpha=\tan^{-1}\left(\frac{7}{24}\right)$ සහ $\beta=\tan^{-1}\left(\frac{5}{12}\right)$ යැයි දී ඇත්නම්, $\cos(\alpha-\beta)$ සොයා ඒ නයින් $\sin(\alpha-\beta)$ ගණනය කරන්න.

(ආ) $t=\tan x$ නම්, $\sin 2x=\frac{2t}{1+t^2}$ බව පෙන්වන්න.

$(1+\sin 2x)(2-\tan x)=2$ වන පරිදි $\left[0,\frac{\pi}{2}\right]$ ප්‍රාන්තරය තුළ පිහිටි $x$ හි අගයන් සොයන්න.

(ඇ) $n\in\mathbb{Z}$ විට, $\theta\neq n\pi$ සඳහා,

$\operatorname{cosec}\theta+\cot\theta=\cot\frac{\theta}{2}$ බව පෙන්වන්න.

ඉහත ප්‍රතිඵලය යොදා, $\operatorname{cosec}\left(\frac{2\pi}{7}\right)+\operatorname{cosec}\left(\frac{4\pi}{7}\right)+\operatorname{cosec}\left(\frac{8\pi}{7}\right)$ හි අගය සොයන්න.

7. $(x_0, y_0)$ ලක්ෂ්‍යයේ සිට $ax+by+c=0$ රේඛාවට ඇති ලම්බ දුර සඳහා ප්‍රකාශනයක් ලබා ගන්න.

$ax+by+c_1=0$ සහ $ax+by+c_2=0$ සමාන්තර රේඛා අතර දුර $\frac{|c_2-c_1|}{\sqrt{a^2+b^2}}$ බව අපෝහනය කරන්න.

$A$ යනු $3x+4y=7$ රේඛාව මත පිහිටි ලක්ෂ්‍යයක් ද $B$ සහ $C$ යනු $3x+4y=2$ රේඛාව මත පිහිටි ලක්ෂ්‍ය ද යැයි ගනිමු. මෙම ලක්ෂ්‍ය තුන පිහිටා ඇත්තේ,

(i) $BC$ ට ලම්බ ව $A$ හරහා යන රේඛාව $(-2,-3)$ ලක්ෂ්‍යය හරහා යන පරිදි ද

(ii) $AB$ රේඛාව $y+3x=0$ රේඛාවට සමාන්තර වන පරිදි ද

(iii) $ABC$ ත්‍රිකෝණයේ වර්ගඵලය 1 වන පරිද ද වේ.

$A$ සහ $B$ හි ඛණ්ඩාංක නිර්ණය කරන්න.

තව ද, $C$ ලක්ෂ්‍යය සඳහා පිහිටුම් දෙකක් තිබිය හැකි බව පෙන්වා, එක් එක් අවස්ථාවේ දී $C$ හි ඛණ්ඩාංක ලබා ගන්න.

[ අනෙක් පිට බලන්න.

8. $x^2 + y^2 + 2g_1x + 2f_1y + c_1 = 0$ සහ $x^2 + y^2 + 2g_2x + 2f_2y + c_2 = 0$ වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වේ නම්, $2g_1g_2 + 2f_1f_2 = c_1 + c_2$ බව පෙන්වන්න.

$$\lambda(y - 7x)y + \mu y(4y - 4x + 3) + (4y - 4x + 3)(y - 7x) = 0$$

සමීකරණය වෘත්තයක් නිරූපණය කිරීම සඳහා $\lambda$ හි සහ $\mu$ හි අගයයන් සොයන්න.

ඒ නයින්, $\lambda$ සහ $\mu$ හි එම අගයයන් සඳහා, මෙම සමීකරණය නිරූපණය කරනු ලබන්නේ,

$y=0$, $4y-4x+3=0$ සහ $y-7x=0$ සමීකරණ මගින් පිළිවෙළින් $OA$, $AB$ සහ $BO$ පාද දෙනු ලබන $OAB$ ත්‍රිකෝණයේ $S$ පරිවෘත්තය බව පෙන්වන්න.

$O$ සහ $A$ හි දී $S$ වෘත්තය ප්‍රලම්බ ව ඡේදනය කරනු ලබන වෘත්තයේ සමීකරණය ලබාගන්න.

9. (අ) $x = t^2 - 1$ සහ $y = t^3 - t$ පරාමිතික සමීකරණ වලින් දෙනු ලබන $C$ වක්‍රය සලකන්න; මෙහි $t \in \mathbb{R}$.

$C$ වක්‍රය එයින්ම ඡේදනය වන $(x, y)$ ලක්ෂ්‍ය සියල්ල, වීජීය ක්‍රමයකින් හෝ ජ්‍යාමිතික ක්‍රමයකින් හෝ සොයන්න.

$t > 0$ විට, $C$ වක්‍රය උඩු අතට අවතල බව පෙන්වන්න.

(ආ) ධ්‍රැවක ආකාරයෙන්, පිළිවෙළින් $r = 2a\cos(\theta - \alpha)$ සහ $r = \lambda \sec(\theta - \alpha)$ සමීකරණවලින් දෙනු ලබන $C_1$ සහ $C_2$ වක්‍ර දෙක විස්තර කරන්න; මෙහි $a$ සහ $\alpha$ ධන නියත වන අතර $\lambda(> 0)$ යනු පරාමිතියකි.

$\lambda < 2a$ නම්, එවිට $C_1$ සහ $C_2$ වක්‍ර ලක්ෂ්‍ය දෙකක දී එකිනෙක ඡේදනය වන බව පෙන්වන්න. එම ලක්ෂ්‍ය $P_1$ සහ $P_2$ නම්, $OP_1P_2$ ත්‍රිකෝණයේ $\Delta$ වර්ගඵලය $\lambda\sqrt{2a\lambda - \lambda^2}$ බව පෙන්වන්න; මෙහි $O$ යනු ධ්‍රැවයයි.

ඒ නයින්, $\Delta$ සඳහා උපරිම අගයක් ගෙන දෙන $\lambda$ හි අගය සොයන්න.

10. $y = mx + c$ රේඛාව, $\dfrac{x^2}{a^2} + \dfrac{y^2}{b^2} = 1$ ඉලිප්සය ස්පර්ශ කරනු ලබයි නම්, එවිට $c^2 = a^2m^2 + b^2$ බව පෙන්වන්න.

ඒ නයින් හෝ අන්ක්‍රමයකින් හෝ, ඉහත ඉලිප්සයට $P(h, k)$ ලක්ෂ්‍යයක සිට ඇඳි ස්පර්ශක යුගලයේ සමීකරණය

$$(kx - hy)^2 = a^2(y - k)^2 + b^2(x - h)^2$$

ආකාරයට ලිවිය හැකි බව පෙන්වන්න.

$P$ සිට ඇඳි ස්පර්ශක දෙක, $Q$ සහ $R$ ලක්ෂ්‍යවල දී $x$ අක්ෂය ඡේදනය කරයි.

(i) $QR$ හි මධ්‍ය ලක්ෂ්‍යය $(\alpha, 0)$ අචල ලක්ෂ්‍යය නම්, $P$ හි පථය $\alpha y^2 = b^2(\alpha - x)$ පරාවලය බව පෙන්වන්න.

(ii) $PQ$ සහ $PR$ ලම්බ නම්, $P$ හි පථය ලබාගන්න.